# කියවීම් ද්‍රව්‍ය

**කෘෂිකර්මය යනු..........**

කෘෂිකර්මය යනු ගොවිතැන හෝ වැවිලි මගින් ආහාර නිපදවීමයි.
සත්ත්ව පාලනයද මීට අයත්ය..

- පාරිභෝගික කෘෂිකර්මය පරිභෝජන අවශ්‍යතා මුල් කරගෙන ද
- ව්‍යාපාරික කෘෂිකර්මය වෙළඳපල මුල් කරගෙන ද සිදු වේ.
- කෘෂිකාර්මික භූමි පරිභෝගය යනු මිනිසා විසින් කෘෂිකාර්මික කටයුතු සඳහා භූමිය පරිභෝගය යනු මිනිසා විසින් කෘෂිකාර්මික කටයුතු සඳහා භූමිය පරිහරණය කිරීමයි.
- ලෝක ජනතාවගෙන් වැඩි කොටසක් කෘෂිකර්මයේ නිරත වීම නිසා විවිධ අයුරින් භූමිය පරිහරණය කරයි.
- පාරිභෝගික කෘෂිකර්මයේදී වැඩි වශයෙන් වී,තිරිඟු වගා කරයි.

## වී වගාව

- ලෝකයේ සෑම මහාද්වීපයකම පාහේ සුළු වශයෙන් හෝ වී වගා කරයි.
- වර්ෂා ජලයෙන් මෙන්ම වාරි ජලයෙන් ද දුෂ්කර කඳුකර ප්‍රදේශවල හෙල්මළු ක්‍රමයට වගා කරයි.
- ආසියානු කලාපයේ වී වගාවෙන් යැපෙන ජන සංඛ්‍යාව ඉතා අධික වේ.
- ආසියානු කලාපයේ නිෂ්පාදනයෙන් වැඩි කොටසක් එම රටවලම ආහාර අවශ්‍යතා සඳහා යොදා ගැනීම.

## තිරිඟු වගාව

- තිරිඟු වගා බිම් මහා පරිමාණ වශයෙන් සිදු කරයි.
- යන්ත්‍ර සූත්‍ර බහුලව භාවිතා කරයි.
- ලොව වැඩි වශයෙන් ම භාවිතා කරන ධාන්‍ය වර්ගයයි.
- වසර පුරාම සැපයිය හැක.

## වතු කෘෂිකර්මය

- විශාල වතුවල වෙළඳපල මුල් කරගෙන සිදු කරන වගාවයි.
- තේ, රබර්,කපු, කෝපි, කොකෝවා පොල් ආදිය වගා කරයි.
- දේශීය මෙන්ම විදේශීය ක්‍රමයන්ද යොදා ගනියි.

- කෘෂිකාර්මික ක්‍රමයක් වුවත් කාර්මික ලක්ෂණ ද පෙන්නුම් කරයි.
- බොහෝ රටවල විදේශිකයන් විසින් ආරම්භ කර පවත්වා ගෙන යයි.

## තේ වගාව

- චීන ජාතිකයන් විසින් තේ වගාව සොයා ගන්නා ලදී.
- ආසියානු කලාපය තේ නිෂ්පාදනයේ ප්‍රමුඛයා වී ඇත.
- ලොව බහුලවම භාවිතා වන පාන වර්ගයකි.
- තේ අලෙවිය වැඩි දියුණු කර ගැනීම සඳහා විවිධ රටවල් ඒකරාශි වී අන්තර් ජාතික තේ වෙළඳපලවල් ආදිය පැවැත්වීම.
- තේ නිෂ්පාදන සඳහා වර්තමානයේදී ගුණාත්මක බව පිළිබඳව වැඩි සැලකිල්ලක් දැක්වීම.

## රබර් වගාව

- බ්‍රසීලයේ කැලෑ භෝගයකි.
- 1890 යුරෝපයේ  මෝටර් රථ කර්මාන්තයේ ඇතිවූ දියුණුවත් සමග  රබර් ඉල්ලුම වැඩිවිය.
- වතු වගාවක් ලෙස තේ වලට පමණක් දෙවැනිය.
- රබර් විශාල වතු වශයෙන් ව්‍යාප්තව ඇත.
- වර්තමානයේදී රබර් වගා කරන රටවල් අමුද්‍රව්‍ය අපනයනය කිරීම මෙන්ම දේශීය වශයෙන් භාණ්ඩ නිෂ්පාදනයටද යොමු වී ඇත.

## සත්ත්ව පාලනය

- ආහාරමය අවශ්‍යතා සඳහා මෙන්ම කාර්මික අමුද්‍රව්‍ය ලබා ගැනීම සඳහාද සත්ව පාලනය සිදු කරයි.
- ගවයන්, බැටළුවන්,එළුවන්, ඌරන්,කුකුළන්ඇති කරයි.

## කිරි පට්ටි පාලනය

- සංවර්ධිත රටවල් ලොව කිරිපට්ටි පාලනයේ ප්‍රමුඛයන් බවට පත්ව ඇත.
- දියුණු ක්‍රම ශිල්ප භාවිතා කරයි.
- වෙළඳපල පුළුල් වී ඇත.
- වර්තමානයේදී කිරි ආශ්‍රිත නිෂ්පාදන පරිභෝජනය වැඩිය.

